# 2019 ජූනි මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්
# "අබ්බා තාත්තේ ! අබ්බා අම්මේ !"

(ශු.මතෙව් 6:9, යෙසායා 66:13)

නොසිතූ විරූ ලෙස පසුගිය පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් අප රටේ සියළුම පුරවැසියන් මෙන්ම සමස්ථ කිතුනු ජනතාව තවමත් සැකයෙන්, බියෙන්, කම්පනයෙන් ජීවත් වෙති. කිනම් මොහොතක හෝ තවත් ප්‍රහාරයක් එල්ල වේදෝයි බියෙන් සිටිති. රජයේ බලධාරින් මෙන්ම බුද්ධි අංශය ඉදිරියේදී මෙවැනි ත්‍රස්ත ප්‍රහාරයන්ගෙන් අප රටේ අසරණ ජනතාව රැක ගනිවි යයි බලාපොරොත්තුවෙන් සිටිති.

එහෙත් අපගේ එකම බලාපොරොත්තුව සහ රැකවරණය අබ්බා තාත්තේ ! අබ්බා අම්මේ! පමණයි. ජේසු ක්‍රිස්තුන් වහන්සේ අපගේ එකම ස්වාමියාණෝ ය. ඔවුන් වහන්සේ මරණය පරාජය කර අදත් ජීවමානව වැඩ සිටින බැවින් සදාතනික ජීවිතය අපට හිමි වී ඇත.

එබැවින් අයැදීමේ සේවකයන් වශයෙන් මේ මාසය පුරාවටම නිරන්තරයෙන් ශුද්ධාත්මයාණන්ට අවදි වෙමින් අබ්බා තාත්තේ ! අබ්බා අම්මේ! කියමින් අප දේශය වෙනුවෙන් නිරන්තර අයැදීමෙන් සමිඳුන් අභියස පෙනී සිටිමු. විශේෂයෙන් අප දේශය තුළ සමූලික පරිනාමනයක් ඇති වෙන ලෙස යාච්ඤා කරමු.

> **" ඔබ ලබා ඇත්තේ නැවතත් බිය ගෙන දෙන**
> **වහල් සේවයේ තත්ත්වයක් නොව,**
> **"අබ්බා පියාණෙනි" යි අමතා යාච්ඤා කිරීමට ඉඩ ඇති**
> **පුත්‍රකම ලැබීමේ තත්ත්වයකි. අප දෙවියන් වහන්සේගේ**
> **දරුවන් බවට ශුද්ධාත්මයාණෝම අප ආත්මය හා එක්ව**
> **සාක්ෂි දරති."** (රෝම 8:15-16)

පළමු සතිය - දිව්‍යමය කියවීම - රෝම 8:14-17
අයැදීමට විශේෂ යොමුව :

අප දේශය තුළට බලපාන ත්‍රස්ත උවදුරු මුලිනුපුටා දමමින් අප දේශය තුළ ධර්මයට මුල්තැන දෙමින් බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් ජනතාව අතර ප්‍රේමාන්විත බැඳීමක් ඇතිවන පිණිස. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* පටු දේශපාලනික අදහස් දරණ පාලකයින්ව ශුද්ධාත්ම බලයෙන් පරිනාමනයක් ඇතිවන පිණිස.
* ත්‍රස්තවාදී සංවිධාන මුළු ලෝකයෙන්ම මුලිනුපුටා දැමෙන ලෙස.
* ත්‍රස්ත ප්‍රහාරය නිසා දැනටමත් රෝහල්වල ප්‍රතිකාර ලබන රෝගීන්ට ආත්මික, ශාරීරික, මානසික සුවය ලැබෙන පිණිසත්, ඔවුන්ට උපස්ථානය කරන වෛද්‍යවරුන්, සාත්තු සේවක සේවිකාවන් සහ ඔවුන්ට සමීප අයවලුන් වෙනුවෙන්.
* කාදිනල් මැල්කම් රංජිත් උතුමාණන් සහ සියළු පූජකයින්ට කිතුනු ජනතාව වෙනුවෙන් ප්‍රඥාවන්තව ක්‍රියා කිරීමට අවැසි ශුද්ධාතම බලය ලැබෙන පිණිස.
* ප්‍රශංසාරාමය වෙනුවෙන්
* වෙනත් අයැදීම්.....

දෙවන සතිය - දිව්‍යමය කියවීම - 2කොරෙන්ති 5:1-5
අයැදීමට විශේෂ යොමුව :

ස්වාමි තාත්තා, දිවැසි එකතුව, සහයක එකතුව ඇතුළු පුබුදුව තුළ වගකීම් ගන්නා සියළු දෙනා හා සමස්ත පුබුදු ජනතාව වෙනුවෙන්. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* සුබැඳි සංඝය වෙනුවෙන්
* විදේශ රටවල පුබුදු ශ්‍රාවක සංඝයන් සහ ඒවායෙහි වගකීම ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* පුබුදු තරුණ - තරුණි අංශයෙන් දියත් කර ඇති වැඩපිළිවෙල වෙනුවෙන්.
* පුබුදු දිවියෙන් ඈත් වී සිටින සියළු දෙනා වෙනුවෙන්
* පිළිකා, වකුගඩු, හෘද්‍යා බාධ මෙන්ම මානසික රෝගවලින් පෙලෙන සියළු දෙනා සහ ඊට හේතුකාරක වන විවිධ විෂමතා තුරන් වන පිණිස.
* ශ්‍රී ප්‍රශංසාරාමයේ අඛණ්ඩව යාච්ඤාවේ යෙදෙන පිරිස සහ පුබුදුව තුළ අයැදීම් සේවාවේ යෙදෙන සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම්....

තෙවන සතිය - දිව්‍යමය කියවීම - ගීතාවලිය 27:1-4

අයැදීමට විශේෂ යොමුව :

අන්තර් ජාලය හරහා විවිධ අනාචාරයනට යොමු වී සිටින වැඩිහිටියන් මෙන්ම පාසල් දරුවන් සහ තරුණ තරුණියන් සහ මත්පැන්, මත් ද්‍රව්‍යයන් වලට ඇබ්බැහි වූවන් වෙනුවෙන් (විනාඩි 10 )

වෙනත් අයැදීම් :

* අයැදීම් සේවාවට සම්බන්ධ සියළු දෙනා වෙනුවෙන්.
* ප්‍රශංසාරාමය, ධර්මාරාමය, රම්‍යාරාමය ඇතුළු පුබුදු මධ්‍යස්ථානවල සහ දූත සේවා නිවෙස්වල කෙරෙන සේවාවන් සහ එහි සිටින සියළු දෙනා වෙනුවෙන්.
* සුදතුම් ගමන සඟරාවට ලිපි සපයන සියළු දෙනා සහ සංස්කරණය කරන අය, ව්‍යාප්ති සේවාව සහ පුබුදු මුද්‍රණාලය වෙනුවෙන්.
* මානසික පීඩනයට පත්ව සිටින සියළු දෙනා සහ උපස්ථායකයන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ....

සතරවන සතිය - දිව්‍යමය කියවීම - රෝම 8:18-25

අයැදීමට විශේෂ යොමුව :

දේශය වෙනුවෙන් (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :

**"හමුවිය හැකි බැවින්**
**සමිඳුන් සොයා යන්න;**
**ළඟම සිටින බැවින්**
**එතුමන් අයදින්න."** (යෙසායා 55:6)

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

***************************